# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2295/10 - 2022 අගෝස්තු මස 31 වැනි බදාදා - 2022.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. -බී. 10/2011

### 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 4 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 01.

### නියෝග

1. මෙම නියෝග 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

1A - PG 5974 - 456 (2022/09)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## I වන කොටස

*කැසිනෝ සූදු ව්‍යාපාරවල නිරත වීම සඳහා වන බලපත්‍රය*

**බලපත්‍රයක් ලබාගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය**

2\. (1) (මෙහි මින්මතු "බලපත්‍රය"යනුවෙන් සඳහන් කරනු ලබන) කැසිනෝ සූදු ව්‍යාපාරයේ නිරත වීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම ඉල්ලුම්කරුවකු විසින් මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියේ සාරානුකූලව, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලුම්පත්‍රයේ අන්තර්ගත කරුණු තහවුරු කිරීම සඳහා අවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් ලේඛන හා තොරතුරු එම ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) නියුක්ත ක්‍රියාකරුවකු විසින් බලපත්‍රයක් ලබාගැනීම සඳහා කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් ම මේ නියෝගවල සිට දින හැටක් අවසන් වීමට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) යම් බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම, බලපත්‍රය දරන්නා විසින් දරනු ලබන බලපත්‍රය කල් ඉකුත් වීමට යටත් පිරිසෙයින් ලිත් මාස හයකට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) යම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත්කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසුව, ඉල්ලුම්පත්‍රය නිසිලෙස ඇගයීමක් කිරීම සඳහා -

(අ) බලපත්‍රය යටතේ ඉල්ලුම්කරු විසින් කැසිනෝ සූදු ව්‍යාපාරය මෙහෙයවනු ලබන හෝ මෙහෙයවීමට අපේක්ෂා කරනු ලබන ස්ථානය හෝ පරිශ්‍රය ;

හෝ

(ආ) ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කැසිනෝ ව්‍යාපාරය සඳහා ඉල්ලුම්කරු විසින් භාවිත කරනු ලබන හෝ භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන යම් වාහනයක්, උපකරණයක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක්,

පරීක්ෂාව ඇතුළුව අමාත්‍යවරයා විසින් අවශ්‍ය බවට සලකනු ලබන එම ඉල්ලුම්පත්‍රයට අදාළ යම් විමර්ශන සහ පරීක්ෂණ පවත්වන ලෙස අමාත්‍යවරයා විසින් බලයලත් නිලධරයා වෙත උපදෙස් ලබා දිය හැකි ය.

(5) බලයලත් නිලධරයා විසින් එම විමර්ශනයේ හෝ පරීක්ෂණයේ අනාවරණයන් අමාත්‍යවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(6) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත්කිරීම සඳහා වූ යම් ඉල්ලුම්පත්‍රයක්,

(අ) සම්පූර්ණ නොවන්නා වූ ;

(ආ) මේ නියෝග ප්‍රකාරව ඉදිරිපත් කර නොමැති වූ ; හෝ

(ඇ) ඉල්ලුම්පත්‍රයට අදාළ මේ නියෝගයේ (4) වන උප නියෝගය යටතේ වූ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් ඉල්ලුම්කරු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී,

අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

**ඉල්ලුම්පත්‍රයක් ඇගයීමේ දී සලකා බැලීමට නියමිත කරුණු**

3. (1) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයක් හෝ බලපත්‍රයක් අලුත්කිරීම සඳහා යම් ඉල්ලුම්පත්‍රයක් ඇගයීමේ දී, බලයලත් නිලධරයාගේ වාර්තාවක් ඇත්නම් එම වාර්තාව සහ වෙනත් කරුණු අතර, පහත දැක්වෙන කරුණු අමාත්‍යවරයා විසින් සලකා බලනු ලැබිය හැකි ය :-

(අ) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්කරුට මනා සහ ස්ථාවර මූල්‍ය පසුබිමක් පවතී ද යන්න හෝ කැසිනෝ සූදු ව්‍යාපාරයේ මූල්‍ය ශක්‍යතාවය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් පවතී ද යන්න ;

(ආ) කැසිනෝ සූදු ව්‍යාපාරයේ මූල්‍ය ශක්‍යතාව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වත්කම් හෝ මූල්‍ය සම්පත් වල අයිතිය හෝ පාලනය එම ඉල්ලුම්කරුට, එහි කොටස් හිමියන්ට හෝ අනුග්‍රාහකයින්ට පවතී ද යන්න පිළිබඳව ;

(ඇ) එම කැසිනෝ සූදු ව්‍යාපාරය මගින් ජාතික ආර්ථිකයට ලබාදීමට ඉඩ ඇති දායකත්වය, සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා කැසිනෝ සූදු ව්‍යාපාරයේ ඇති වැදගත්කම සහ ශ්‍රී ලංකාවට ලැබීමට ඉඩ පවතින වෙනත් මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ.

4. අමාත්‍යවරයා විසින් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය ඇගයීම සම්බන්ධයෙන් ඔහුට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි වැඩිදුර තොරතුරු හෝ ලේඛන ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

**බලපත්‍ර ගාස්තුව**

5. (1) අවුරුදු පහක කාල සීමාවක් හෝ එහි යම් කොටසක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ බලපත්‍ර ගාස්තුව රුපියල් මිලියන පන්සියයක් වේ.

(2) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරන ලද කාලසීමාව අවුරුදු විස්සක් නොයික්මවන අවුරුදු පහේ ගුණාකාරවන අවස්ථාවක දී, එම සම්පූර්ණ කාල සීමාව සඳහා ම අදාළ බලපත්‍ර ගාස්තුව පූර්වයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ අලුත් කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් අදාළ බලපත්‍ර ගාස්තුව පූර්වයෙන් ගෙවන ලද බවට සාක්ෂි අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

**බලපත්‍ර ප්‍රදානය කිරීම**

6. (1) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් ඇගයීමෙන් පසුව, 3 වන නියෝගයේ සඳහන් කරුණු පිළිබඳව සෑහීමකට පත් වීමෙන් පසුව, සහ ඉල්ලුම්කරු විසින් 5 වන නියෝගයේ සඳහන් අදාළ බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින් -

(i) බලපත්‍රයක් මගින් අවසර දී ඇති ස්ථානයේ දී හෝ පරිශ්‍රයේ දී කැසිනෝ සූදු ව්‍යාපාරයේ නිරත වීම සඳහා ඉල්ලුම්කරුට අවසරය ලබා දෙමින් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය ;

(ii) බලපත්‍රයේ සඳහන් කොන්දේසි වෙනස් කිරීමක් සහිතව හෝ රහිතව බලපත්‍රය අලුත් කරනු ලැබිය හැකි ය ; හෝ

(iii) අවස්ථාවෝචිත පරිදි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කලින් අවලංගු කරන්නේ නම් හෝ බලපත්‍රය දරන්නා විසින් අත්හිටුවනු ලබන්නේ නම් මිස, සෑම බලපත්‍රයක්ම අවම වශයෙන් අවුරුදු පහක කාලසීමාවක් සඳහා වලංගු වන්නේ ය.

**බලපත්‍රය අවලංගු කිරීම**

7. යම් බලපත්‍රයක්

(අ) එකී බලපත්‍රය අවසන් කිරීම සම්බන්ධයෙන් එකී බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති යම් ප්‍රකාශිත විධිවිධානයක් ප්‍රකාරව ;

(ආ) 8 වන නියෝගය යටතේ පවත්වනු ලබන විමර්ශනයකින් පසුව ගනු ලබන ක්‍රියාමාර්ගයක් අනුව,

අමාත්‍යවරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

**විමර්ශනයකින් පසුව බලපත්‍රය අවලංගු කිරීම**

8. යම් තොරතුරක් ලද පසුව හෝ යම් තැනැත්තෙකු විසින් කරන ලද පැමිණිල්ලක් අනුව -

(අ) බලපත්‍රය දරන්නා, බලපත්‍රය දරන්නාගේ යම් නියෝජිතයකු හෝ බලපත්‍රය දරන්නාගේ උපදෙස් අනුව ක්‍රියාකරන හෝ බලපත්‍රය දරන්නාගේ නියෝජිතයෙකුගේ උපදෙස් අනුව ක්‍රියාකරන බලපත්‍රලාභියාගේ යම් සේවා නියුක්තිකයකු විසින් 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත හෝ මේ නියෝග ඇතුලු යම් අදාළ නීතියක විධිවිධානයක් උල්ලංඝනය කර ඇද්ද යන්න තීරණය කිරීම සඳහා ;

(ආ) පනත හෝ මේ නියෝග ප්‍රකාරව නියම කර ඇති අවස්ථාවක දී, බලපත්‍රය දරන්නා විසින් අමාත්‍යවරයා වෙත සාවද්‍ය තොරතුරු සපයා ඇද්ද යන්න තීරණය කිරීම සඳහා ; හෝ

(ඇ) බලපත්‍රය දරන්නා විසින් බලපත්‍රයේ සඳහන් යම් නියම හෝ කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් උල්ලංඝනය කර ඇද්ද යන්න තීරණය කිරීම සඳහා,

බලපත්‍රය දරන්නෙකුට එරෙහිව බලයලත් නිලධරයා මගින් විමර්ශනයක් පවත්වන ලෙස අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

9. පැහැර හැරීම් හෝ උල්ලංඝනය වීමක් සිදු වී නොමැති බව ඔප්පු කිරීම සඳහා හේතු දැක්වීමට ඇත්නම් අවම වශයෙන් දැන්වීමේ දින සිට දින විස්සක් ඇතුලත එම හේතු ලිඛිතව දක්වන ලෙස ද, සාක්ෂි තිබේ නම් එම සාක්ෂි ලබා දෙන ලෙස ද එම බලපත්‍රය දරන්නාට දැනුම් දෙමින් 8 වන නියෝගය යටතේ වන යම් විමර්ශනයක් ආරම්භ කිරීමට පෙරාතුව දින විස්සකට නොඅඩු ලිඛිත දැන්වීමක් බලපත්‍ර දරන්නා වෙත ලබා දිය යුතු ය.

10. අනුකූලතා නිලධරයා විසින් එම බලපත්‍රය දරන්නා එම විමර්ශනයේ දී නියෝජනය කිරීම සහ බලපත්‍රය දරන්නා විසින් ගනු ලැබිය යුතු යැයි මෙම නියෝග මගින් නියම කර ඇති එම විමර්ශනය හා සම්බන්ධ සියලු පියවර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

11. බලයලත් නිලධරයා විසින්, 8 වන නියෝගය යටතේ ආරම්භ කරන ලද විමර්ශනයකට අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවක් සලකා බැලීමෙන් පසුව 8 වන නියෝගයේ සඳහන් යම් ක්‍රියාකාරකම් එකක් හෝ කිහිපයක් සිදුවී ඇතැයි අමාත්‍යවරයා සෑහීමකට පත්වේනම්, අමාත්‍යවරයා විසින්, බලපත්‍රය අවලංගු කිරීම හෝ අවලංගු කිරීම වෙනුවට ඃ

(අ) අනනුකූලතාව නිවැරදි කර ගැනීම සඳහා බලපත්‍රය දරන්නාට විධාන ලබාදීම ; හෝ

(ආ) කැසිනෝ සූදු ව්‍යාපාරය බලපත්‍රය දරන්නා විසින් ක්‍රියාත්මක කිරීමට යටත් අදාළ නීතීන්ට අනුකූලව බලපත්‍රයට අතිරේක නියම සහ කොන්දේසි හඳුන්වා දීම කරනු ලැබිය හැකි ය.

12. 11 වන නියෝගය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය බලපත්‍රය දරන්නා වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

**බලපත්‍රයක් ආපසු භාර දීම**

13. බලපත්‍රය දරන්නා විසින් ගෙවිය යුතු බදු, අයබදු, තීරුබදු හෝ ගාස්තු ඇතුළුව රජයට අයවිය යුතු සියලුම ගෙවීම්, ගෙවීම සඳහා වන බලපත්‍රය දරන්නාගේ පාර්ශ්වයේ වගකීමට අගතියක් නොමැතිව, බලපත්‍රයේ මුල් පිටපත සහ එහි යම් සංශෝධන සමග අමාත්‍යවරයාට ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් යම් බලපත්‍රය දරන්නෙකු විසින් ස්වකීය බලපත්‍රය ආපසු භාර දිය හැකි ය.

14. එවැනි ආපසු භාරදීමක් බලාත්මක වන්නේ අමාත්‍යවරයා විසින් එය ලිඛිතව අනුමත කිරීමෙන් පසුව පමණක් වන අතර, එම බලපත්‍රය දරන්නා විසින් බදු, අය බදු, තීරු බදු හෝ ගාස්තු ඇතුළුව රජයට අයවිය යුතු සියලුම ගෙවීම් නිසි පරිදි පියවා ඇති බවට ප්‍රමාණවත් සහ පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් එකී අනුමතය ලබා දිය යුතු ය.

## II වන කොටස

*බලපත්‍රය දරන්නකුගේ වගකීම්*

**බලපත්‍රය දරන්නන් විසින් අනුකූලතා නිලධරයන් පත් කිරීම**

15. කැසිනෝව සම්බන්ධයෙන් අනුකූලතා නිලධරයා ලෙස කටයුතු කිරීම සඳහා සුදුසු සහ යෝග්‍ය තැනැත්තෙකු සෑම බලපත්‍ර දරන්නෙකු විසින්ම පත් කරනු ලැබිය යුතු ය.

16. යම් අදාල නීති සහ බලපත්‍රයේ නියම සහ කොන්දේසි වලට අනුකූලව කැසිනෝ සූදු ව්‍යාපාරය කටයුතු කරන බවට අනුකූලතා නිලධරයා වග බලා ගත යුතු ය.

17. බලපත්‍රය දරන්නකු, බලපත්‍රය දරන්නකුගේ යම් අනු නියෝජිතයකු, හෝ බලපත්‍රය දරන්නකු හෝ එම බලපත්‍රය දරන්නාගේ යම් අනුයෝජිතයෙකුගේ උපදෙස් මත ක්‍රියාකරන යම් බලපත්‍රය දරන්නාගේ සේවකයකු විසින්, යම් අදාල නීති හෝ බලපත්‍රයේ අඩංගු නියම සහ කොන්දේසි උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති අවස්ථාවකදී, එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳ සිදුකරනු ලබන යම් විමර්ශනයක්, පරීක්ෂණයක් හෝ ඇගයීමක් සඳහා අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු සහය වීම සඳහා අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් බලයලත් යම් නිලධරයකු විසින් ඉල්ලූ විට එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීමට අදාළ සියලු තොරතුරු සහ ලේඛන අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයා විසින් බලය පවරන ලද නිලධරයකු වෙත එම අනුකූලතා නිලධරයා විසින් ලබා දෙනු ලබන සහතික වීම එම බලපත්‍රය දරන්නාගේ කාර්යය විය යුතු ය.

**කැසිනෝව තුළ හැසිරීම**

18. බලපත්‍රය දරන්නා විසින් එහි සේවකයන්, අනුග්‍රාහකයන් හෝ කැසිනෝව තුළ සිටින වෙනත් පුද්ගලයින් විසින් පහත සඳහන් ක්‍රියාවන් සිදු නොකරන බව සහතික කිරීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු ය. -

(අ) ගණිකා වෘත්තියේ නියැලීම හෝ වෙනත් නීති විරෝධී කටයුත්තක් සඳහා පෙළඹවීම ;

(ආ) බලපත්‍ර රහිතව මුදල් ණයට දීම හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම ;

(ඇ) බීමත්ව, අවිධිමත්ව හෝ කළහකාරී ලෙස හැසිරීම ;

(ඈ) නීති විරෝධී ඔට්ටු ඇල්ලීම හෝ සූදු ක්‍රීඩාවන් වල නිරත වීම ; හෝ

(ඉ) අදාළ යම් නීතියකට පටහැනිව සිදුකරනු ලබන ඕනෑම වරදක් හෝ නීති විරෝධී ක්‍රියාකාරකමක්.

**බාලවයස්කරුවන් කැසිනෝවකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම නොකළ යුතු බව**

19. බාල වයස්කරුවෙකුට කිසිදු කැසිනෝවකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම හෝ කිසිදු සූදු ක්‍රීඩාවකට සහභාගී වීම සපුරා තහනම් ය.

20. බාල වයස්කරුවෙකු කැසිනෝවක සිටී නම්, බලපත්‍රය දරන්නා වහාම අදාළ බාල වයස්කරු කැසිනෝවෙන් ඉවත් කිරීමට අවශ්‍ය සාධාරණ පියවර ගත යුතු ය.

21. කැසිනෝවකට ඇතුළුවන පුද්ගලයෙකු හෝ කැසිනෝව තුළ සිටින පුද්ගලයෙකුගෙන් වයස හෝ හඳුනාගැනීමේ සාක්ෂි ඉදිරිපත්කරන ලෙස ඉල්ලා සිටීමට බලපත්‍රය දරන්නාට අයිතියක් ඇත්තේ ය.

22. වයස අවුරුදු විසි එකට අඩු පුද්ගලයින් කැසිනෝවෙන් තහනම් කරමින් බලපත්‍රය දරන්නා විසින් කැසිනෝව තුළ දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

**පොත් තැබීම, ගිණුම් සහ වාර්තා**

23. බලපත්‍රය දරන්නා විසින් කැසිනෝවේ සියලු මෙහෙයුම් කටයුතු වලට අදාළ සියලු බැංකු ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක වෙන් වෙන් වශයෙන් ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

24. බලපත්‍රලාභියා විසින් සත්‍ය වූත් සාධාරණවූත් මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් සකස් කිරීමට හැකි වන පරිදි සහ විගණන කටයුතු නිවැරදිව හා පහසුවෙන් සිදු කල හැකි වන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ මූලධර්මවලට අනුකූලව ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතු ය.

25. බලපත්‍රය දරන්නා විසින් මූල්‍ය වර්ෂය අවසන් වූ පසු මාස හයක කාලයක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම් ඇතුළු පහත දැක්වෙන ලේඛන සකස් කරනු ලැබිය යුතු ය. :-

(අ) මූල්‍ය වර්ෂය සඳහා අදාළ අවස්ථාවක දී වෙළඳ ගිණුම ;

(ආ) ලාභ අලාභ ප්‍රකාශනයක් හෝ මූල්‍ය වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ;

(ඇ) කැසිනෝව සම්බන්ධයෙන් බලපත්‍රය දරන්නාගේ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ සැබෑ, සාධාරණ සහ නිවැරදි තත්වය නියෝජනය වන පරිදි මූල්‍ය වර්ෂය අවසානයේ කැසිනෝ ශාලාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් ; සහ

(ඈ) කැසිනෝ ක්‍රීඩා පිළිබඳ දළ ආදායම සහ කැසිනෝ ක්‍රීඩා පිළිබඳ ශුද්ධ ආදායම ඇතුළත් ප්‍රකාශන.

26. යම් බලපත්‍රය දරන්නකුගේ ගිණුම් සම්බන්ධව ගිණුම් ප්‍රකාශන හෝ එම ගිණුම් සම්බන්ධ වෙනත් තොරතුරු අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයාගේ උපදෙස් අනුව ශ්‍රී ලංකාවේ වෙනත් නිසි බලධාරියෙකු වෙත ලබාදෙන මෙන් 23 වන නියෝගයේ සඳහන් වන බැංකුවේ කලමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධාරියෙකු වෙත අමාත්‍යවරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

27. බලපත්‍රය දරන්නෙකු විසින් මෙම නියෝග යටතේ තබා ගත යුතු සියලු පොත්, ගිණුම් සහ වාර්තා වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම් අවම වශයෙන් වසර හයක කාලයක් දක්වා තබා ගත යුතු අතර අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින අවස්ථා වල දී ඉදිරිපත් කළ යුතු ය.

28. මෙම නියෝග වල සඳහන් පොත්, ගිණුම් සහ වාර්තා සියලු අවස්ථා වල දී,

(අ) ආරක්ෂිත ස්ථානයක තැබිය යුතු ය ; සහ

(ආ) ක්ෂණිකව හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි විය යුතු ය.

**විගණන**

29. බලපත්‍රය දරන්නාගේ සියලු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන ගණකාධිකාරී සමාගමක් විසින් සාමාන්‍යයෙන් පිළිගත් විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කරන බවට බලපත්‍රය දරන්නා විසින් සහතික විය යුතු ය.

30. බලපත්‍රය දරන්නා විසින් එක් එක් මූල්‍ය වර්ෂයේ අවසාන දිනයේ සිට මාස හයක කාලයක් ඇතුළත හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන යම්කිසි කාලසීමාවක් ඇතුලත විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශවල පිටපත් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

31. අමාත්‍යවරයා විසින් මූල්‍ය ප්‍රකාශන හා විගණකවරයා විසින් ඉටු කර ඇති සේවාවන් සම්බන්ධයෙන් බලපත්‍රය දරන්නාගෙන් හෝ අදාළ විගණකවරයාගෙන් අමතර තොරතුරු හෝ ලේඛන ඉල්ලා සිටිය හැක.

**ක්‍රීඩා පිළිබඳ වාර්තා**

32. බලපත්‍රය දරන්නෙකු විසින්,

(අ) සියලු ක්‍රීඩා ගනුදෙනු සම්බන්ධ නිවැරදි, සම්පූර්ණ, කියවිය හැකි, ස්ථිර වාර්තා ; සහ

(ආ) පහත සඳහන් වාර්තා ඇතුළුව ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ කොටස් හඳුනා ගැනීම ඇතුළු සවිස්තරාත්මක අනුබද්ධ වාර්තා සහිතව ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතුය. -

(i) අමාත්‍යවරයා විසින් අනුමත කළ හැකි ගිණුම් කාල සීමාවක් තුල මේස ක්‍රීඩා වල පරාජය, දිනුම සහ එක් එක් මේසයක දිනුම් සහ පැරදුම් ප්‍රතිශතය මෙන්ම එක් එක් මේස ක්‍රීඩා වර්ග වල පරාජය, දිනුම සහ දිනුම් සහ පැරදුම් ප්‍රතිශතය පිළිඹිබු වන පරිදි වෙන් වෙන් වශයෙන් සකසන ලද ක්‍රීඩා වාර්තා ;

(ii) අනෙකුත් සියලුම ක්‍රීඩා සම්බන්ධයෙන් (i) සඳහන් තොරතුරුවලට සමාන තොරතුරු පිළිඹිබු කරන වෙන් වෙන් වශයෙන් සකසන ලද ක්‍රීඩා වාර්තා ;

(iii) එක් එක් ස්ලොට් යන්ත්‍රයක් සම්බන්ධයෙන් පිරිවැටුම් සහ ගෙවීම් පිළිඹිබු කරන සහ දෛනික, මාසික, ත්‍රෛමාසික, වාර්ෂික සහ දොළොස් මාස ගණනය කල අනුපාතය (rolling basis) මත සත්‍ය රඳවා ගැනීමේ ප්‍රතිශතය හා න්‍යායික රඳවා ගැනීමේ ප්‍රතිශතයට සංසන්දනය කළ ස්ලොට් යන්ත්‍ර විශ්ලේශන වාර්තා ;

(iv) අභ්‍යන්තර පාලන ප්‍රමිතීන්ට අනුකූලව බලපත්‍රය දරන්නා විසින් පවත්වාගෙන යා යුතු වාර්තා ; සහ

(v) අමාත්‍යවරයා විශේෂයෙන්ම පවත්වා ගත යුතු බවට අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් වාර්තා.

**වෙනත් වාර්තා**

33. සමාගමක් වන අවස්ථාවක දී, බලපත්‍රය දරන්නෙකු විසින් පහත සඳහන් වාර්තා පවත්වාගෙන යා යුතු ය.

(අ) එම සමාගමේ සංශෝධිත ව්‍යවස්ථා ලේඛන ඇතුළු ව්‍යවස්ථා ලේඛන ;

(ආ) සියලුම සේවකයින්ගේ පත්වීම් දිනය, සේවා තත්ත්වය සහ අදාල වේ නම්, සේවය අවසන් කළ දිනය ඇතුලත් ස්ථිර වාර්තා ;

(ඇ) සියලුම කොටස් හිමියන්ගේ රැස්වීම් වාර්තාවන් ;

(ඈ) සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවන් ; සහ

(ඉ) (ලැයිස්තුගත කර නොමැති සමාගමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී), අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන්නේ නම්, සෑම කොටස් හිමියෙකුගේම නම, ලිපිනය, හිමි කොටස් ගණන සහ කොටස් අත්පත් කරගත් දිනය ඇතුලත් සියලුම කොටස් හිමිකරුවන් පිළිබඳ රෙජිස්ටරයක්.

**සේවා යෝජකයින් සහ ඔවුන්ගේ සේවකයින්**

34. කැසිනෝ පවත්වාගෙන යාම සඳහා මෙම නියෝග වල නිශ්චිතව දක්වා ඇති පරිදි සෑම බලපත්‍රය දරන්නෙකු විසින් අවශ්‍ය ප්‍රධාන සේවකයින් සේවයේ යෙදවිය යුතු ය.

35. ප්‍රධාන සේවකයකු යන්නෙන් -

(අ) කළමනාකරණ තනතුරක් දරන කැසිනෝවක් පවත්වා ගෙන යාමේ දී අභිමතය පරිදි ක්‍රියා කිරීම සම්බන්ධ තීරණ ගැනීමට බලය පවතින යම් තැනැත්තෙකු ; හෝ

(ආ) කැසිනෝවක පහත සඳහන් ඕනෑම ක්‍රියාකාරකමකට අදාළ ඕනෑම සේවකයෙක් -

(i) ක්‍රීඩා කටයුතු හැසිරවීම ;

(ii) කැසිනෝ පරිශ්‍රය තුළ මුදල් හෝ චිප්ස් ප්‍රවාහන කටයුතු සිදුකිරීම ;

(iii) කැසිනෝවේ අනුග්‍රාහකයන් සඳහා මුදල් හෝ චිප්ස් මාරු කිරීම ;

(iv) කැසිනෝ පරිශ්‍රය තුළ මුදල් හෝ චිප්ස් ගණනය කිරීම ;

(v) කැසිනෝවේ ආරක්ෂාව සහ නිරීක්ෂණ කටයුතු ;

(vi) ක්‍රීඩා යන්ත්‍ර ක්‍රියා කරවීම, නඩත්තුව, සවි කිරීම හෝ පිළිසකර කිරීම් ;

(vii) ඉහත සඳහන් ඕනෑම ක්‍රියාකාරකමක් අධීක්ෂණය කිරීම ;

(viii) අමාත්‍යවරයා විසින් බලපත්‍රය දරන්නෙකු ලිඛිතව දැනුම් දී ඇති මෙම නියෝගයේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කැසිනෝවක මෙහෙයුම් සම්බන්ධ වෙනත් ඕනෑම ක්‍රියාකාරකමක්,

සිදුකරන යම් තැනැත්තෙකු අදහස් වේ.

36. ප්‍රධාන සේවකයන් ලෙස සේවයේ යොදවන තැනැත්තන් ඒ ධුරයට අදාළ කර්තව්‍යන් හා කාර්යයන් ඉටු කිරීමට නිසි යෝග්‍යතාවයකින් යුත් සුදුසු තැනැත්තන් බවට සහ ප්‍රමාණවත් පුහුණුවක් ලබා ඇති බවට සෑම බලපත්‍රය දරන්නෙකු විසින්ම තහවුරු කළ යුතු ය.

## III වන කොටස

### *අර්ථ නිරූපනය*

37. මෙම නියෝග වල -

"පනත" යන්නෙන්, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත අදහස් වේ ;

"ඉල්ලුම්කරු" යන්නෙන්, සමාගමක් අදහස් වන අතර එයට නියුක්ත ක්‍රියාකරුවෙකු ඇතුළත් වේ. ;

"බලයලත් නිලධරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ පත්කළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ. ;

"කැසිනෝ" යන්නෙන්, පනතේ 5 වන වගන්තිය යටතේ ඒ යෙදුමට නියම කර ඇති එම අර්ථයම පැවතිය යුතු ය. ;

"කැසිනෝ සූදු ව්‍යාපාරය" යන්නෙන්, කැසිනෝ ව්‍යාපාරයක් අදහස් වේ. ;

"අනුකූලතා නිලධරයා" යන්නෙන්, අනුකූල නිලධරයකු ලෙස 15 වන නියෝගය යටතේ පත් කරන තැනැත්තෙකු අදහස් වේ. ;

"සමාගම" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් අදහස් වේ. ;

"චිෂය" යන්නෙන්, කැසිනෝවක සූදු සහ ගණුදෙනු සඳහා පමණක් භාවිතා කරන එහි මුහුණතෙහි දක්වා ඇති මුදල් අගයක් සඳහා හුවමරු කල හැකි සහ බලපත්‍රලාභියා විසින් එහි බලපත්‍රලත් පරිශ්‍රයක් තුල භාවිතය සඳහා පමණක් අනුග්‍රාහකයන්ට නිකුත් කරන හෝ අලෙවි කරන නිෂ්පාදිත ද්‍රව්‍ය අදහස් වේ. ;

"විකුණුම් පිරිවැය" යන්නෙන්, සියලුම අලෙවිකරණ, වෙළඳ දැන්වීම හා ප්‍රචාරන පිරිවැය, බලපත්‍රය දරන්නා විසින් අනුග්‍රාහකයන් වෙනුවෙන් දරනු ලබන ගුවන් ටිකට්පත්, හෝටල් නවාතැන් පහසුකම්, ආහාරපාන සඳහා පිරිවැය, බලපත්‍රය දරන්නා විසින් ගෙවිය යුතු කිසියම් කොමිස් මුදලක්, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව බොල් ණය සහ අවිනිශ්චිත ගිණුම්, සහ බලපත්‍රය දරන්නා විසින් අනුග්‍රාහකයන් වෙනුවෙන් දරනු ලබන වෙනත් අනුපූරක අයිතමයන් සඳහා වන පිරිවැය අදහස් වේ. ;

"නියුක්ත ක්‍රියාකරු" යන්නෙන්, සංශෝධිත පරිදි 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2අ වගන්තියට අනුව කැසිනෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවේ කැසිනෝ සූදු ව්‍යාපාරයට සම්බන්ධ නියුක්ත ක්‍රියාකරුවකු අදහස් වන අතර ඔහු ශ්‍රී ලංකාවේ දී කැසිනෝ සූදු ව්‍යාපාරයට සම්බන්ධ වීමට මෙම නියෝග යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු විය යුතු ය. ;

"සූදුව" යන්නෙන්, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ ඒ යෙදුමට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය. ;

"සූදු යන්ත්‍රය" යන්නෙන්, තනි පුද්ගලයන් විසින්, සූදු ක්‍රීඩා කිරීම හෝ අවදානම් සහිත හා දක්ෂතාවය මත සිදුවන තරග ක්‍රීඩා කිරීම, කැසිනෝවක මුදල් දිනාගැනීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රයක් අදහස් වේ. ;

"පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති" යන්නෙන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ගිණුම් ප්‍රමිති කමිටුව විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අදහස් වේ. ;

"පොදුවේ පිළිගත් විගණන ප්‍රමිති" යන්නෙන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතට අනුකූලව දේශීය කොන්දේසිවලට ගැලපෙන පරිදි උචිත වෙනස් කිරීම් සමග පවතින ගණකාධිකාරී සම්මේලනයේ (IFAC) පවතින විගණන හා සහතික කිරීමේ මණ්ඩලය (IAASB) විසින් ප්‍රකාශයට පත් කරන ලද පවතින විගණන ප්‍රමිති (ISA) මත පදනම් වන ශ්‍රී ලංකා විගණන ප්‍රමිති අදහස් වේ. ;

"දළ සූදු ආදායම" යන්නෙන්, අනුග්‍රාහකයන් විසින් ඔට්ටු අල්ලන ලද මුදල් ප්‍රමාණයෙන් මුළු දිනුම් ගණන අඩු කිරීමෙන් ලැබෙන අගය අදහස් වේ. ;

"බලපත්‍රය දරන්නා" යන්නෙන්, 6 වන නියෝගය යටතේ නිකුත් කළ බලපත්‍රයක් දරන්නෙකු අදහස් වේ. ;

"බාල වයස්කරු" යන්නෙන්, වයස අවුරුදු විසි එකට අඩු ඕනෑම ස්වභාවික පුද්ගලයකු අදහස් වේ. ;

"ශුද්ධ සූදු ආදායම" යන්නෙන්, දළ සූදු ආදායමෙන් විකිණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන අගය අදහස් වේ. ;

"දිනුම්" යන්නෙන්, යම් මූල්‍ය හෝ මූල්‍ය නොවන ත්‍යාග අදහස් වේ.

## I වන උපලේඛනය

### කැසිනෝ බලපත්‍ර සඳහා ආකෘති ඉල්ලුම්පත්‍රය

(2 වන නියෝගය)

01. ඉල්ලුම් කරන්නේ කුමක් සඳහා ද යන්න - ☐ පවතින කැසිනෝ ව්‍යාපාරයක් සඳහා
☐ අලුත් කැසිනෝ ව්‍යාපාරයක් සඳහා

02. ඉල්ලුම්කරු - ..........
(අයිතිකරු හෝ නීත්‍යානුකූල තැනැත්තෙකු වන කැසිනෝ බලපත්‍ර ඉල්ලුම්කරු කැසිනෝවේ අයිතිකරු වේ.)

03. ඉල්ලුම්කරුගේ ලිපිනය - ..........

04. බදු ගෙවුම්කරුගේ හැඳුනුම් අංකය - ..........
(TIN) (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ)

05. සමාගම / ව්‍යාපාර ලියාපදිංචි අංකය - ..........

06. කැසිනෝවේ නම - ..........

07. කැසිනෝවේ පිහිටි ස්ථානය / ලිපිනය - ..........

08. කැසිනෝව පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය - ..........

09. කැසිනෝව කැසිනෝ ජාලයකට අයත් වේ ද යන්න - ☐ ඔව්
☐ නැත

10. පිළිතුර 'ඔව්' නම් -
(අ) ජාලයේ නම - ..........
(ආ) එයට ඇතුළත් කැසිනෝ සංඛ්‍යාව - ..........
(ඇ) ක්‍රියාත්මක වන බල ප්‍රදේශ - ..........

11. කැසිනෝ විවෘතව තබන වේලාව -
විවෘත කරන වේලාව - ..........
වසා තබන වේලාව - ..........

12. අනුකූලතා නිලධරයකු පත් කර තිබේ ද? ☐ ඔව්
☐ නැත

13. එසේ නම්, අනුකූලතා නිලධරයාගේ නම - ..........

14. අනුකූලතා නිලධරයා සම්බන්ධ කරගත හැකි තොරතුරු - ..........

15. කැසිනෝ කළමනාකරු
(කරුණාකර කැසිනෝ කලමනාකරුගේ තොරතුරු සපයන්න.)
(අ) නම - ..............................................................................
(ආ) ලිපිනය - ..............................................................................
(ඇ) ජා.හැ.ප. අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය - ..............................................................................
(ඈ) නිකුත් කළ ස්ථානය සහ දිනය - ..............................................................................
(ඉ) විද්‍යුත් ලිපිනය - ..............................................................................
(ඊ) දුරකථන අංකය/ අංක - ..............................................................................

16. පවතින සූදු -
(කරුණාකර යෝජිත කැසිනෝ පිළිබඳ තොරතුරු සපයන්න. ඇමුණුමක් ලෙස සම්බන්ධ කළ හැකි ය.)

සූදු මේස

| සූදු මේසයේ ස්වභාවය | සූදු මේස සංඛ්‍යාව |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

ස්ලොට් මැෂින්

| ස්ලොට් මැෂින් වල ස්වභාවය | ස්ලොට් මැෂින් සංඛ්‍යාව |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

වෙනත් සූදු (1) ..............................................................................
(2) ..............................................................................
(3) ..............................................................................

17. අත්සන - ...........................................................................................................................................................................

ඉල්ලුම් පත්‍රය නියමිත තැනැත්තා හෝ සමාගම් ව්‍යවස්ථාවට අනුව අත්සන් කිරීමට බලය දුන් තැනැත්තන් විසින් අත්සන් කළ යුතු ය. අත්සන්කරු විසින් මෙම ඉල්ලුම්පත්‍රය අත්සන් කරමින් -

(1) කැසිනෝ සූදු ව්‍යාපාරයක් මෙම ආකෘති ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ හෝ පරිශ්‍රයේ ආරම්භ කිරීම පිණිස 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 2 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි බලපත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍රයකින් ඉල්ලුම්කර ඇති බවට ද,

(2) මෙම ආකෘති ඉල්ලුම්පත්‍රය නිවැරදිව සහ සත්‍ය ලෙස සම්පූර්ණ කළ බවට ද; සහ

(3) අත්සන්කරු සියලු නීති සහ බලපත්‍ර නියමයන්ට අනුකූල වන බවට ද,

තරයේ ප්‍රකාශ කර සිටී.

| | අත්සන්කරු 1 | අත්සන්කරු 2 | අත්සන්කරු 3 |
|---|---|---|---|
| සම්පූර්ණ නම | | | |
| විදේශ ගමන් බලපත්‍රය / ජා.හැ.ප. අංකය | | | |
| නිකුත් කළ දිනය | | | |
| අත්සන | | | |
| දිනය | | | |

EOG 09 - 146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.